කෘෂි නවීකරණ ව්‍යාපෘතිය
விவசாய நவீனமயமாக்கல் திட்டம்
Agriculture Modernization Project

# කෘෂිකර්ම අමාත්‍යාංශය

## කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය
## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනයේ (IDA) මූල්‍ය සහයෝගිතාවයෙන්, දේශ හවුල්කාරිත්ව උපායමාර්ග (CPS) වලට අනුරූපව කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර, ඉන්, කුඩා ඉඩම්හිමි ගොවීන් හට, තරඟකාරී හා අලෙවිකළ හැකි වෙළඳ ද්‍රව්‍ය නිෂ්පාදනයටත්, වෙළඳපොල අවශ්‍යතා සඳහා නිපැයුම් කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමටත්, ඉන් වැඩිවර්ධනය කළ වාණිජ්‍යකරණයට යොමුවීමට සහාය වීමත් අපේක්ෂා කරයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම සඳහා ඉතිරි වී ඇති කාලය වසර 01 පමණ වන අතර, ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 90.23 කි.

(ලෝක බැංකුවේ ණය අරමුදල් ප්‍රමාණය ඇමරිකන් ඩොලර් මිලියන 64.23 වන අතර, යුරෝපා සංගම් සිය අරමුදල් ප්‍රදානය ඇමරිකන් ඩොලර් මිලියන 26.0 කි.)

ඒ අනුව, පහතින් දක්වා ඇති **ඌව, උතුරු මැද සහ නැගෙනහිර පළාත්** ව්‍යාපාති කළමණාකරන ඒකකයන්හි **(PPMU)** පවත්නා තනතුරු පිරවීම සඳහා එහි සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් 2019.03.05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS 2) - තනතුරු 02**
(උතුරු මැද සහ නැගෙනහිර)
**02. පළාත් ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (PS 3) - තනතුරු 02**
(උතුරු මැද සහ ඌව පළාත්)

## 01. පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS 2)

- අවම සුදුසුකම්:

(I) ප්‍රථම උපාධියක් (කෘෂිකර්මය, ව්‍යාපෘති කළමනාකරණය, ගිණුම්කරණය, මූල්‍ය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය යන විෂයයන් ආවරණය වන පරිදි) සාර්ථකව සම්පූර්ණ කිරීම **හෝ** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් වෙනත්, අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ, ආශ්‍රිත සාමාජිකත්වය/ සමූහ වෘත්තීය සුදුසුකම්

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර 11 ක කළමනාකරණ තලයේ පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

(II) ප්‍රථම උපාධියක් (කෘෂිකර්මය, ව්‍යාපෘති කළමනාකරණය, ගිණුම්කරණය, මූල්‍ය ව්‍යවසාය, ආර්ථික විද්‍යාව, කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය යන විෂයයන් ආවරණය වන පරිදි) සාර්ථකව සම්පූර්ණ කිරීම **හෝ** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්

**සහ**

පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ, ආයතනික/ වරළත් සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර 09 ක කළමනාකරණ තලයේ පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 04 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

(III) ප්‍රථම උපාධියක් (කෘෂිකර්මය, ව්‍යාපෘති කළමනාකරණය, ගිණුම්කරණය, මූල්‍ය, වාණිජ්‍ය, ව්‍යවසාය, ආර්ථික විද්‍යාව, කළමනාකරණය ව්‍යාපාර පරිපාලනය යන විෂයයන් ආවරණය වන පරිදි) සාර්ථකව සම්පූර්ණ කිරීම **හෝ** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

**සහ**

පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ, ආයතනික/ වරළත් සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 03 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

(IV) රජයේ දීපව්‍යාප්ත සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්

**සමග**

I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

## 02. පළාත් ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (PS 3)

- අවශ්‍ය සුදුසුකම්:

(I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ, ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසුව, කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

(II) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ, ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනය, අදාළ ක්ෂේත්‍රයේ ආයතනික වරළත් සාමාජිකත්වය හෝ සමූහ වෘත්තීය සුදුසුකම්

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසුව, කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

(III) රජයේ දීපව්‍යාප්ත සේවයක I පංතිය නිලධාරියකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්

**සමග**

I පංතිය තනතුරක, සුදුසුකම් අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

- විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල පළපුරුද්ද අත්‍යාවශ්‍ය වන අතර, ලෝක බැංකුව අරමුදල් සැපයූ ව්‍යාපෘතිවල ලද පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
- අදාළ අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය වන විට වයස අවුරුදු 64 කට වැඩි අයවලුන් හට අයදුම් කළ නොහැක.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය:**
සුදුසුකම් හා පළපුරුද්ද මත නම් ලයිස්තු ගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය:** 2019.03.05 දිනැති අංක 01/2019 දරන චක්‍රලේඛය මත පදනම්ව වැටුප් ගෙවීම සිදු කෙරේ.

**සේවයේ යෙදවීමේ කොන්දේසි:**
සියලුම පත්කිරීම්, 2019.03.05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව සිදු කෙරේ.

**අයදුම්පත්:**
සියලුම අයදුම්පත්, අදාළ ජීව දත්ත, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර හා සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන්, **2022 ඔක්තෝබර් 11** දිනට හෝ ඊට පෙර ලැබෙනසේ පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය. දැනට රජයේ සේවයේ/ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.

**අයදුම් කරනු ලබන තනතුර හා පළාත අයදුම්පත් බහාලු කවරයේ වම් ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.**

**ලේකම්,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය,**
**කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය,**
**අංක 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**